# බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාව
# විශේෂ මහා සභා රැස්වීමේ වාර්තාව.
# 2019.11.05

වර්ෂ 2019 ක් වූ නොවැම්බර් මස 05 වන අඟහරුවාදා දින පෙ.ව. 10.00 ට බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේ දී පැවැත්වූ අයවැය විශේෂ මහා සභා රැස්වීමේ වාර්තාවයි.

**සහභාගීත්වය.**

01. ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා
02. ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා
03. ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා
04. ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා
05. ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා
06. ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා
07. ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා
08. ගරු මන්ත්‍රී ඩබ්.පී. චමින්ද මැතිතුමා
09. ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා
10. ගරු මන්ත්‍රීනි එම්. ගයාත්‍රි කාංචනා මැතිණිය
11. ගරු මන්ත්‍රීනි ඩී.පී. වාසනා උදයංගනී මැතිණිය
12. ගරු මන්ත්‍රී යූ.එල්. තුසිත චාමින්ද මැතිතුමා
13. ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා
14. ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා
15. ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා
16. ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා
17. ගරු මන්ත්‍රීනි පී. ටෙක්ලා ශ්‍යාමලී මැතිණිය
18. ගරු මන්ත්‍රීනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය
19. ගරු මන්ත්‍රීනි ඒ.ආර්.එස්. සංජීවනී අතුකෝරල මැතිණිය
20. ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා

**නොපැමිණි**

01. ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා
02. ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා

මීට අමතරව ප්‍රාදේශීය සභා ලේකම් එල්.එච්. අනිල් රංජන් මහතා ද සහභාගී විය.

**<u>ආගම සිහි කිරීම හා සභාව පිළිගැනීම.</u>**

ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සියලුම ගරු සභිකවරුන්, ලේකම්තුමා ප්‍රධාන නිලධාරීන් හා මාධ්‍යවේදීන් පිළිගැනීමෙන් අනතුරුව පළමුව ආගම සිහිපත් කරන ලදී. ඉන් අනතුරුව විනාඩියක නිශ්ශබ්දතාවය රැකීමෙන් රට වෙනුවෙන් සටන් වැද මියගිය රණවිරුවන් හා මියගිය සභිකවරුන්, නිලධාරීන් හා සේවකයන් සිහිපත් කරන ලදී.

( ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා, ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා සභාවට සහභාගි වීම සිදුවිය. )

**<u>(අ) පසුගිය රැස්වීමේ වාර්තාව සම්මත කිරීම</u> :-** නැත

**<u>(ආ) සභාපතිවරයා විසින් කරනු ලබන විශේෂ නිවේදන</u>**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** අපේ සභා කාලයේ දෙවැනි අයවැය සභාව තමයි අද පැවැත්වෙන්නේ. අපි දන්නවා පහුගිය වර්ෂයේ අපිට සංවර්ධන ඉලක්ක වලට පුළුවන්

ආකාරයෙන් සමහර ඒවාට ලඟා වුණා. සමහර දේවල් වලට ලඟා වෙන්න බැරි වුණා. ඒකට හේතු කීපයක් තියෙනවා. අපේ මුදල් අයවීම පිළිබඳව යම් යම් ගැටළු කාරණා තිබුණා. නිශ්චිතව අපිට වරිපනම් බදු වලින් 75% ක් වගේ ප්‍රමාණයක් තමයි අයකර ගන්න හැකි වුණේ. ඉතිං ඒ ආකාරයෙන් ගත්තම අපි බලාපොරොත්තු වෙනවා 2020 වර්ෂයට අද ඉදිරිපත් කරන අයවැය තුළින් අපේ ප්‍රාදේශීය සභාවේ 2020 වර්ෂයේ අරමුණු, සියලු කාරණා, ඉලක්කයන් ලඟා කර ගන්න ඔබතුමන්ලාගේ සහයෝගය. ඒ වගේම අපි කොට්ඨාශ 12 තුළ අපිට ජනතාවට අවශ්‍ය වැඩ කටයුතු කරගෙන යන්න හැකියාව ලැබෙයි කියලා බලාපොරොත්තු වෙනවා.

( ගරු මන්ත්‍රීනි එම්. ගයාත්‍රි කාංචනා මැතිණිය, ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා, ගරු මන්ත්‍රීනි පී. ටෙක්ලා ශ්‍යාමලී මැතිණිය සභාවට සහභාගි වීම සිදුවිය. )

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** මට මේ අවස්ථාවේ පොඩි කාලයක් ඉල්ලා සිටිනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඉන්න මන්ත්‍රීතුමා ඇයි හදිස්සි. මගේ පිළිගැනීමේ කතාව කරන්නවත් අවස්ථාව නැනේ. මොකක්ද හදිස්සිය.

ඒ වගේම අපි නිශ්චිතව බලාපොරොත්තු වෙච්ච මධ්‍යම රජයෙන් ලැබෙන්න ඕන මුදල්, පළාත් සභාවෙන් අපිට ලැබෙන්න ඕන ප්‍රතිපාදනයන් අපිට පහුගිය වර්ෂයේදී ලැබුණේ නෑ. අපි බලාපොරොත්තු වෙනවා ඉදිරි වර්ෂයේ හරි සභාවේ වැඩ කටයුතු කරගෙන යන්න ඒ ප්‍රදානයන් අපිට ලැබෙයි කියලා. ඒක තුළ ඒ ආකාරයෙන් තමයි අපිට සභාවේ ඉදිරි කටයුතු කරගෙන යන්න හැකියාව ලැබෙන්නේ. මොකද අපිට ප්‍රධාන අයවීම විදියට තියෙන්නේ වරිපනම් බදු මුදල් විතරයි. ඉතිං ඒක තුළ අපි බලාපොරොත්තු වෙනවා අනෙකුත් ප්‍රභවයන්ගෙන් මම සඳහන් කරපු මධ්‍යම රජයෙන්, පළාත් සභාවෙන් විමධ්‍යගත මුදල් ලැබෙයි කියලා. ඒ බලාපොරොත්තුව ඇතිව තමයි මේ අයවැය ඉදිරිපත් කරන්නේ.

ඒ වගේම අපි සඳහන් කරන්න ඕන පහුගිය වර්ෂයේ සංවර්ධන ඉලක්කයන්, ප්‍රාදේශිය සභාවේ වැඩ කටයුතු කරගෙන යන්න ලැබිච්ච සහයෝගය අපි ඉදිරිපත් කරන්න ඕන. උප සභාපතිතුමා ප්‍රධාන සියලු මන්ත්‍රීතුමන්ලා, මන්ත්‍රීතුමියන්ලා සහයෝගය ලබා දුන්නා. අප ප්‍රාදේශීය සභාවේ නිශ්චිත ඉලක්ක වලට ලඟා වෙන්න ලේකම්තුමා ප්‍රධාන නිලධාරීන් ඒ උපරිම දායකත්වය ලබා දුන්නා. යම් යම් අසීරු අවස්ථා වල පවා, අපිට නිලධාරීන් නොමැති අවස්ථාවල පවා, ස්ථාන මාරුවීම් වෙද්දි පවා ලේකම්තුමා ඒ පිළිබඳව මැදිහත්වෙලා ඒ අවශ්‍ය සහයෝගය ලබා දුන්නා මේ කටයුත්ත කරගෙන යන්න. අයවැය කියන්නේ ලේසි පහසු කටයුත්තක් නෙමෙයි. ඒක තුළ නිපුණත්වය තියෙන නිලධාරීන් අවශ්‍යයි මේ කටයුත්ත කරගෙන යන්න. ලේකම්තුමා, ඒ නිලධාරිනියන් සෑහෙන්න කැපවීමකින් මේ කටයුත්තට දායකත්වය ලබා දුන්නා. ඒකට ස්තුතිවන්ත වෙනවා. ඒ වගේම පහුගිය කාලයේ අපේ ඉල්ලීමක් නොවුණත්, මගේ ඉල්ලීමක් නොවුණත් යම් යම් මන්ත්‍රීවරුන්ගේ ඉල්ලීම මත වජිර අබේවර්ධන ගරු ඇමතිතුමා පළාත් පාලන ඇමතිවරයා විදියට යම් කිසි කර්මාන්ත කීපයකට යෝජනා එවලා තිබුණා. ඒ පිළිබඳවත් සභාවේ ස්තුතිය පළ කරනවා. ගම්පෙරළිය වැඩසටහන යටතේ බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභා බලප්‍රදේශයේ පාරවල් රාශියක් සංවර්ධනය වුණා. ඒ පිළිබඳවත් සභාපතිවරයා විදියට ස්තුතිවන්ත වෙනවා. ඒ ආකාරයෙන් ගත්තම පහුගිය වර්ෂයේ අපිට ඒ කටයුතු සාර්ථක කරගෙන යන්න, ඒ වගේම පළාත් සභාවේ හිටපු අපේ මන්ත්‍රීවරු, ඒ වගේම ආණ්ඩුකාරතුමන්ලා අපිට ඒ දක්වපු සහයෝගය පිළිබඳව මේ අවස්ථාවේ ස්තුතිය පළ කරනවා.

ඔබතුමාට මොකක්ද දන්නේ නෑ නිශ්චිත කාරණයක් සඳහන් කරන්න තියෙන්නේ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** සුභ උදෑසනක් සියලුම දෙනාට මුලින්ම. ගරු සභාපතිතුමනි විශේෂයෙන්ම 2020 ඉදිරි අවුරුද්ද ඉලක්ක කර ගෙන ඔබතුමා වෙහෙස මහන්සි වෙලා සෑහෙන්න කාලයක් අරගෙන සභා යෝජනා එකතු කර ගෙන අපේ සභාව මේ මොහොතේ තියෙන තත්ත්වයට සාපේක්ෂව බැරෑරුම් කටයුත්තක් තමයි ඔබතුමා සඳහන් කළ ආකාරයට මේ ඉදිරි අයවැය සකස් කිරීම. ඒ හින්දා මේ අවස්ථාවේ ඔබතුමා දක්වපු සහයෝගයට ස්තුතිවන්ත වෙනවා. මේ අයවැය ලේඛනය අපේ අතට පත් වෙන්නේ ගිය සතියේ දවසක. ඒ හින්දා මම හිතනවා ඉදිරි අවුරුද්දේ සම්පූර්ණ සභාවේ ඉලක්ක, සභාවේ අරමුණු ඉටුකරගන්න වැඩපිළිවෙල මේ. මේක වඩා ගැඹුරින් සාකච්ඡා කළ යුතු කාරණයක් බවට පත්වෙනවා. මම එහෙම කියන්නේ පහුගිය වර්ෂයේ, 2019 ට ඉදිරිපත් කරපු අයවැය ලේඛනය අපි අත්දැකීමෙන් දන්නවා පහුගිය වර්ෂය තුළ ඒ ඉලක්ක අපි කොයිතරම් දුරකට හඹා ගියාද, අපිට ඒකට තිබුණ හැකියාව මොකක්ද, බාධක මොනවාද හා ඒ වෙනුවෙන් සභාවක් විදියට සමස්ථයක් වශයෙන් ගත්තම ගරු සභාපතිතුමා සහ මේ මන්ත්‍රී මණ්ඩලය ඒ වගේම ලේකම්තුමා ප්‍රමුඛ නිලධාරි මණ්ඩලය ඒ සියල්ලන්ගේම මැදිහත්වීම ඇතුලේ අපි සභාවක් විදියට 2019 වර්ෂයට අදාළව අපේ අයවැය ඇස්තමේන්තුවේ ඉලක්කගත සංවර්ධන කාර්යභාරය,

ඉලක්කගත සේවා කාර්යභාරය අපි සැලකිය යුතු මට්ටමකින් මැදිහත් වුණාද, නැද්ද කියන කාරණය. ඒ නිසා මම විශ්වාස කරනවා මේ මොහොතේ මේ ඉදිරි අයවැය අපි ඉතා ගැඹුරින් සාකච්ඡා කළ යුතුයි කියලා. ඒ හින්දා මම ඔබතුමාට මේ මොහොතේ ඉතා කාරුණික යෝජනාවක් කරන්නයි හදන්නේ. වෙන මුකුත් හින්දා නෙමෙයි පහුගිය දින කීපය තුළ රටේ තියෙන වාතාවරණය අනුව, මැතිවරණයත් එක්ක රාජකාරි වලට සහභාගි වුණා. ඔබතුමාලා අපි කවුරුත් දන්නවා එළඹෙන මැතිවරණය ඉතා තීරණාත්මක මැතිවරණයක්. ඒ හින්දා මෙතන ඉන්නේ විශේෂයෙන්ම දේශපාලනයට සෘජුව සම්බන්ධ වූ පිරිසක්. ඒ අයගේ ඒ වැඩ කටයුතුත් එක්ක මේක අධ්‍යයනය කිරීමට තරම් සාධාරණ කාලයක් තිබුණේ නෑ. ඒ හින්දා ඔබතුමා සභාවක් හැටියට ඒ වගකීම අරගෙන මැදිහත් වෙලා මේ ඉදිරිපත් කරන අයවැයේ කරුණු කාරණා නිවැරදිව, සංසන්දනාත්මකව සලකා බලලා ඒ සම්බන්ධව නිවැරදි තක්සේරුවකින් අපේ අයවැයට සහයෝගය ලබා දිය යුතුයි. ඒ හින්දා මගේ අදහස මේ මොහොතේ අයවැය සාකච්ඡාවට බඳුන් කරන්න තරම් කාලයක් නෙමෙයි. මොකද කාල වකවාණුව මදියි නිවැරදිව අධ්‍යයනය කරලා මේකට මැදිහත්වීම කරන්න. ඒ හින්දා මම මේ සභාවට ඉතාමත් ගෞරවයෙන් යෝජනා කරනවා. දැන් ඉදිරි සතියේ මැතිවරණය. මේ වකවානුවෙන් පසු දිනකට මේක අඩාල කරලා කල් තබන්න. මොකද හේතුව අපි මීට වැඩිය ගැඹුරින් මේක සාකච්ඡා කරමු. ඒ වෙනුවෙන් කාලය යොදාගන්න. මම හිතන්නේ කාලය මදි වෙන්නේ නෑ. මම හිතන්නේ අපි ගිය පාරත් නොවැම්බර් මාසේ අයවැය ඉදිරිපත් කරේ. මේක මුලට ගන්න ඇත්තේ මැතිවරණය නිසා කාලසීමාව මදිවෙයි කියලා වෙන්න ඇති. අපි මැතිවරණයෙන් පසුව සතියකට සභාව අඩාලව කල් තබනවානම් ඒක සුදුසුයි කියන එක මම මේ සභාවට යෝජනා කරනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, ඉන්දික විජයවික්‍රම මන්ත්‍රීතුමා ඉදිරිපත් කරපු කරුණු, මම ඔබතුමා එක්ක පෞද්ගලිකව කතා කරා. අපි මේක වඩාත් ගැඹුරින් සාකච්ඡා කරමු. ඉදිරි කාලයට අඩාලව කල් තියලා ගැඹුරින් සාකච්ඡා කරමු. පහුගිය අයවැය ඉලක්ක කොච්චරකට යන්න පුළුවන් වුණාද, ඒ නිසා අපි ඉදිරිකාලයේ සභාවක් විදියට ප්‍රදේශයේ ජනතාවට සේවය කිරීම මොන පක්ෂයක් වුණත් අපේ යුතුකමක්. ඒ නිසා මේ පිළිබඳව ගැඹුරින් සාකච්ඡා කිරීම කළයුතුයි. බොහොම පැහැදිලිව අපි දේශපාලනයේ නියැලෙන කට්ටියක්. ඒ නිසා අපි ගෞරවයෙන් ඉල්ලා සිටිනවා සාමූහිකව තීන්දුවක් අරගමු. මම ඒ යෝජනාව ස්ථිර කරනවා. පහසු දිනයක් අද සාකච්ඡා කර ගන්න. පහසු දිනයක් යොදා ගමු. කොයි වෙලාවකවත් මේක විරෝධාකල්පයක් නොවේ කියලා සලකන්න ඕන. මම හිතුවා ඒක මේ සියලු මන්ත්‍රීවරුන් පිළිගන්නවා ඇති. කවුරුත් දේශපාලන වශයෙන් සම්බන්ධ වෙලා ඉන්නවා කොට්ඨාශය තුළ. ඇත්තටම මේක අධ්‍යයනය කරන්න පොඩ්ඩක්වත් ඉඩක් හම්බවුණේ නෑ. ඇත්ත කතාව ඒක.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මෙහෙමයි මන්ත්‍රීතුමා, මටත් කඩිමුඩියේ අවශ්‍යතාවයක් තිබුණේ නෑ. ඔබතුමාලා දන්නවා. ඕනනම් මම දින වකවානු කියන්නම්. අපි ජූලි මාසේ ඉඳන් තමයි මේකට ලේස්ති වුණේ. දින කියන්නම්. අපි ජූලි මාසේ 30 වෙනිදා සියලුම මන්ත්‍රීවරු කැඳෙව්වා. ඊටත් කලින් යෝජනා ඉල්ලුවා. ජූලි මාසේ 30 කැඳෙව්වා. ඊට පස්සේ අයවැය ඇස්තමේන්තු සමාලෝචන රැස්වීමක් තිබුණා අගෝස්තු මාසේ 30 වෙනිදා. ඊට පස්සේ ගිය මහ සභාවේදී කිවුවා. අයකිරීම් සම්බන්ධව ගැසට් පත්‍රය ගිය සභාවට ඉදිරිපත් කරලා සම්මත කර ගත්තා. ඊට පස්සේ ගත්තම ගිය මහා සභාවේදී අවසානයේ කිවුවා. දින 05 කට කලින් ඔබතුමන්ලාට ලියුම යවලත් තියෙනවා. මැතිවරණය තියෙන්නේ 16 වෙනිදා. 19 වෙනිදට එනවා මහා සභාව. ඊට පස්සේ ඕක තියන්න දිනයක් කවදද තියෙන්නේ. ඕකෙන් පස්සේ කවුරු දිනුවත් රට පුරා පිළිගැනීමේ රැස්වීම් තියාවි. ඒක එතකොට වෙනවා. නැතෙයි කියන්න බෑ. එතකොට අද සියලු මන්ත්‍රීවරු පැමිණිලා ඉන්නවා. මම කියන්නේ අද මේක තියෙන එක තමයි හොඳ. මේ නිලධාරීන්ටත් මේ සම්බන්ධව යම් යම් ඉලක්ක තියෙනවා. අපිට ඒක ඉදිරියට බලපානවා පහුවෙලා තියාගන්න බැරි වුණොත්. මහා සභාවත් අඩාලව කල් තියනවා. අයවැය සභාවත් අඩාලව කල් තියනවා.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** දෙසැම්බර්වල පුළුවන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දෙසැම්බර් මාසයට යන්න බෑ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, මේ අයවැය සම්බන්ධයෙන් විරෝධයක් දක්වන අදහසින් නෙමෙයි මේ කියන්නේ. අපි කිවුවේ ඇත්තටම අපිට මේ පහුගිය දවස් කීපය ඇතුලේ මේක අධ්‍යයනය කරන්න තරම් කාල සීමාවක් තිබුණේ නෑ. ඉඩක් තිබුණේ නෑ. මේක වාර්ෂික අයවැය. කලින් වර්ෂයේ අපේ යෝජනා සම්බන්ධයෙන් සංසන්දනයක් කරලා ඕන මේ අයවැය සම්බන්ධව සාකච්ඡා කරන්න. එතකොට මේක සම්බන්ධව සාකච්ඡා කරන්න අපිට කාලය සම්බන්ධයෙන් ප්‍රශ්නයක් තිබුණා මේක සංසන්දනය කරන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දැන් නොතියා මැතිවරණයෙන් පස්සෙත් ඕකම තමයි වෙන්නේ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** එහෙම වෙන්නේ නෑ. මැතිවරණ කාර්යභාරයට තමයි අපි මැදිහත් වෙලා ඉන්නේ. ජයග්‍රහණයෙන් පස්සේ පිළිගැනීමේ කටයුතු හා වෙනත් කටයුතු තියෙන්නේ. දේශපාලන ඉලක්ක වලට ඊට පස්සේ මැදිහත් වෙන්නේ නෑ. ඒ නිසා අපිට අවස්ථාව ගන්න පුළුවන් මේකට.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අද තියමු. අද කැඳවපු එක අද තියමු. 19 වෙනිදා මහා සභාවත් එනවා. ඒ සභාවටත් මුහුණ දෙන්න ඕන. ඊට පස්සේ ඒකත් මැතිවරණය කිට්ටුව එන්නේ. 16 වෙනිදා මැතිවරණය. 18 වෙනිදා කියනවා ප්‍රතිඵල ලබා දෙන්නේ. ඒ පාර 19 වෙනිදා මහා සභාව තව සතියක් විතර අඩාලව කල් තියන්න සිදු වෙනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** නෑ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** නැත්තේ නෑ. 19 වෙනිදා මහා සභාව අනිවාර්යයෙන් අඩාලව කල් තියන්න සිදු වෙනවා. එතකොට ඒ සභාවයි මේ සභාවයි දෙකම අඩාලව කල් තියන්න සිදු වෙනවා. සභාවල් දෙකක් අඩාලව කල් තියන්න බෑ මන්ත්‍රීතුමා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** මේ ඉතා සාධාරණ ඉල්ලීමක්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** 19 වෙනිදා මහා සභාව කොහොමත් කල් තියන්න සිදු වෙනවා. ඊට කලින් දවසේ තමයි ප්‍රතිඵලය ලබා දෙන්නේ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ප්‍රතිඵලය ලබා දෙන එක සභාවට බලපාන්නේ නෑ. මේක හරි සාධාරණයි මේ මොහොතේ. මේක අධ්‍යයනය නොකර අපි මේක සාකච්ඡා කරන එක වැරදියි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** නෑ අපි අද තියමු.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** අපි යෝජනාවක් කරේ. මේ ගරු සභාවට අපි යෝජනාවක් කරේ සාධාරණ කාලයක් ලබා දෙන්න කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කාලය ලබා දීලා තියෙන්නේ මන්ත්‍රීතුමා. සෑහෙන්න කාලයක් දුන්නා. අධ්‍යයනය කරන්න කාලයක් ලබා දුන්නා.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** මහජන නියෝජිතයෝ වශයෙන් ඔබතුමන්ලත් දේශපාලඥයෝ. අපිත් දේශපාලඥයෝ. ඔබතුමා දන්නවා අයවැය ලේඛනය ඉදිරිපත් වුණාම අපි ඒක අධ්‍යයනය කරලා බලලා තමයි එන්නේ. එදා දීලා තිබුණා. අද අරගෙන ආවා. තාම බැලුවේ නෑ. දැන් තමයි මෙතනදි පොඩ්ඩක් හරි බැලුවේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ගිය සැරේට වැඩිය ලොකු වෙනසක් නෑ.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** එහෙමෙයි කියලා බෑ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමාට දවස් හතරකට කලින් ලැබුණනේ.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** ඔබතුමා කිවුවා පහුගිය අයවැයේ ඉලක්ක වලට යන්න බැරි වුණා කියලත්, සානුකම්පිතව මේක අපි කල් දාමු.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** නෑ කල් දාන්නේ නෑ. කල් දාන්න විදියක් නෑ. ඊළඟ මහා සභාවත් මට විශ්වාස නෑ. කල් දාන්න වේවි. ඒක නිසා සභා දෙකක් අඩාලව කල් තියාගෙන යන්න බෑ මන්ත්‍රීතුමා. අද තියමු.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** අපි යෝජනාව ස්ථිර කරලා තියෙන්නේ සභාපතිතුමා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** නෑ. අපිත් යෝජනාව ස්ථිර කරගෙන තියෙන්නේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** බෙදීමකට යමු.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** සභාවක්, තියෙනවාද නැද්ද කියන එක තීරණය කරන්න බෙදීමකට යන්න බෑ. එහෙම යන්න බෑ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** සභාපතිතුමනි, සාකච්ඡා කිරීමට තරම් මේ මොහොතේ කාලසීමාවක් නෑ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** හත්වෙනි මාසේ ඉඳන් මේකට ලෑස්ති වුණේ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** මේ යෝජනා කෙටුම්පත අපි අතට පත්වෙන්නේ දවස් හතරකට කලින්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දවස් හතරකට කලින් හරි පත්වෙනවානේ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, ඒක තමයි මම යෝජනා කරේ මේ මොහොතේ රටේ වාතාවරණය එක්ක.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අද තියෙනවා. ඔය ගොල්ලන්ගේ විරෝධතාවය සඳහන් කරන්නම්.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** අපිට කමක් නෑ. මේ අවස්ථාවේ මේ සාධාරණ ඉල්ලීමට කන් දෙන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** සභා ඔක්කොම කල් තියාගෙන යන්න බෑ අබේසේකර මන්ත්‍රීතුමා. හැමදාම කරන්නේ සභා කල් තියන එකනේ. විරෝධතා තියෙන අය නැගිටලා යන්න.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** අපි විරෝධතාවයක් නෙමෙයි කරන්නේ. අපි යෝජනාවක් ගෙනල්ලා තියෙනවානේ. සභාපතිතුමා අපේ ලේකම්තුමාගෙන් හරි උපදෙස් ගන්න. අඩාලව කල් තියන යෝජනාව ගෙනාවම බෙදීමකට යන්න ඕන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** හරි බෙදීමකට යනවා.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** ඡන්ද විමසීම පොඩ්ඩක් නතර කරන්න කියලා මම කියනවා. මේ වෙලාවේ පෙ.ව 11.00 ට කලින් ඔබතුමාට මේක ඉවර කර ගන්න පුළුවන්නම් බෙදීමකට ගිහින් හරි කර ගන්න. නැත්නම් මම අනිවාර්යයෙන්ම පෙ.ව 11.00 ට මේ සභාවෙන් පිටවෙන්න ඕන මගේ අත්‍යාවශ්‍යම දෙයක් නිසා. මේ කියන කරුණුවලත් සාධාරණයක් තියෙනවා. මට මේකේ මෙහෙම පිටුවක් පෙරලන්න බැරි වුණා. අපි මේ කණ්ඩායමේ මන්ත්‍රීවරු විදියට වෙනදා සභාවක් තියෙන කොට දිනය දාන්න කලින් අහනවා මේ දිනයට දාන්න පුළුවන්ද කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ගිය සභාවේදීත් කිව්වා මන්ත්‍රීතුමා ඉවර වෙන කොට.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** ඊටත් අමතරව අපි කණ්ඩායමක් විදියට ගත්තම අයවැය කියන්නේ ඉතාම බැරෑරුම් කටයුත්තක්. අනෙක් මන්ත්‍රීවරු එක්ක සාකච්ඡා කරාද කියන්න මම දන්නේ නෑ. මට ඊයේ රෑ තමයි ඔබතුමා ඒ පිළිබඳව කතා කරේ. මම ගිය සඳුදා මේ දිනය වෙන් කරගෙන අම්බලන්ගොඩ යන්න හිටියේ. දැන් ඒක නිසා මම පෙ.ව 11.00 වෙනකොට මෙතනින් පිට වෙන්න ඕන. ඒක නිසා ඊට කලින් කර ගන්න පුළුවන් දෙයක් තියෙනවා නම් කර ගන්න. නැත්නම් මේක පිළිබඳව ඡන්දයකට ගිහිල්ලා ඡන්දය ප්‍රකාශ කරලා අවසානයේ ගැටළුවක් වුණොත් මම ඒ වගකීම කිසි දෙයක් ගන්නේ නෑ.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** විරුද්ධවීමක් නෙමෙයි මේ කරන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මමත් මේකේ බබෙක් නෙමෙයි. මට මේකේ සියලු දේවල් තේරෙනවා. අබේසේකර මන්ත්‍රීතුමා මේක අද කරන්න ඕන. ඔබතුමන්ලා මේක සද්භාවයෙන් නෙමෙයි ඉදිරිපත් කරන්නේ. අනිවාර්යයෙන් මේක සද්භාවයෙන් ඉදිරිපත් කරන යෝජනාවක් නෙමෙයි. මහා ලොකු දෙයක් මේකේ ඔළුවට අරගෙන ඉන්නේ. ඔබතුමා කියන දේ මම කියන්නම්. එක මනුස්සයෙකුට ශත මෙච්චරයි කියයි වෙන් කරලා තියෙන්නේ. ඕක කොහොමත් කියන එකේ අපි අද තියමු. ඊට පස්සේ අනුමතයි කියාවි.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඔබතුමා මේ අයවැය ඉදිරිපත් කරපු කාරණයේදී එක එක්කෙනා කියන දේවල් ඔක්කොම දන්නවා නම් ඒක ඔබතුමා තීරණය කරලා අයවැය අපිට ඉදිරිපත් කරලා සාකච්ඡා කරන්නේ නැතුව ඒකත් ඔබතුමාම කරන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** බෙදීමකට යමු.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඔබතුමා කලබල වෙන්න එපා. අනවශ්‍ය ප්‍රශ්නයක් ඇති වෙන්නේ කලබලය නිසා.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** බෙදීමකට යමු. ඒක අපිට කිසි ගැටළුවක් නෑ. ඔබතුමා ටිකක් කල්පනා කරලා බලන්න. අපි මේක ගෙනාවේ සානුකම්පිතව.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, සහෝදර මන්ත්‍රීවරුනි, මන්ත්‍රීවරියනි. ඇත්ත වශයෙන්ම සභාවෙන් නැගුණ යෝජනාව අනුව ඇත්තටම ඒ සියලු මන්ත්‍රීවරුන් දේශපාලන කටයුතුවල නියැලිලා ඉන්න වෙලාවක් මේ. මේ කරුණ පිළිබඳව අපේ ලියනගේ මන්ත්‍රීතුමා කිවුවා වගේ අපිට එහෙම දැනුම් දීමක් සිදු වුනේ නෑ සභාපතිතුමනි. මමත් කල්පනා කරේ අපිට මේ ඉතාමත් වැදගත් දින කිහිපයක්. ගෙයින් ගෙට යෑමේ වැඩසටහන් ක්‍රියාත්මක වෙන වෙලාවේ ලියනගේ මන්ත්‍රීතුමා කිවුවා වගේ මමත් හිතනවා මේක වෙනත් දිනයකට සාමුහික තීන්දුව මත කල් තැබීමක් සිදු වුණොත් හොඳයි කියලා. සියලු දෙනාගේම සහයෝගය මත ඉදිරි වර්ෂය සඳහා එන යෝජනාව මේක.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** සියලු දෙනාගේ සහයෝගයෙන්?

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** සියලු දෙනාගේ සහයෝගය මත අපි ඒ විදියට කටයුතු කරන්න ඕන නිසා ඒ යෝජනාවට එකඟ වෙන්න ඕන. ඉතාම වටින යෝජනාවක් මේක.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, සියලු දෙනාටම සුභ උදෑසනක් වේවා. ඇත්ත වශයෙන්ම මෙතනදි ඇති වෙච්ච අදහස් දිහා බැලුවම ගැටළු දෙකක් මතු වෙනවා. එකක් කාර්යය බහුල වෙලාවක් කියලා අයවැය කෙටුම්පත සම්මත කිරීම පසුවට යෙදීමට යෝජනාව. ඒ වගේම සමහර මන්ත්‍රීවරු කියනවා මේක කියවන්න අවස්ථාවක් ලැබුණේ නෑ කියලා. ගරු මන්ත්‍රීවරුනී අපි මේ බෝපෙ පෝද්දල බලප්‍රදේශයේ ජනතාව වෙනුවෙන් 2020 වර්ෂයේදී ඉටු කළ හැකි කාර්යය කුමක්ද, ඒ කාර්යය අපි කාගේත් එකගතාවයකින් ඉටු කරන්නේ කොහොමද කියන එක තීරණය කරන්නයි අයවැය වාර්තාවක් සභාවට ඉදිරිපත් කරලා සම්මත කරන්නේ. ඒ සඳහා අපෙන් යෝජනා කැඳවීමක් කල් ඇතුව සිදු කරලා තියෙනවා. මේක දිහා බැලුවහම සමහර මන්ත්‍රීවරු, ප්‍රජාමූල මණ්ඩල ඒ සඳහා යෝජනා ඉදිරිපත් කරලා තියෙනවා. ඒ වගේම අපි කොයිතරම් දේශපාලන කාර්යය බහුලත්වයක සිටියත් අපි ප්‍රාදේශීය සභාවේ නියෝජිතයන් හැටියට පළමු බැඳීම තියෙන්නේ ප්‍රාදේශීය සභාව සමගයි කියන එක කරුණාකරලා මතක තියා ගන්න. ඉන් පිටත ජාතික දේශපාලනයේදී වෙනත් මහා මැතිවරණ වලදී වෙනත් පොදු සේවා කටයුතු වලදී අපි ඉන්නේ ඊට වඩා පිටුපසින්. අපිව ප්‍රාදේශීය සභාවට නියෝජිතයෝ හැටියට අපේ කොට්ඨාශ වලට ජනතාව පත්කරලා එවලා තියෙන්නේ ප්‍රාදේශීය සභාව බලාගනින් කියලා විතරයි. අපි දේශපාලනයේ එක එක කඳවුරු වලට බෙදිලා වෙනත් මැතිවරණවලදී දේශපාලනය කරන්නේ. ඇත්තටම මේ අයවැය ලේඛනයේ තියෙන්නේ පිටු 23 යි. මේ පිටු 23 ත් අපිට කියවන්න යෝජනා හා වෙනත් කරුණු වලට තියෙන්නේ, ඉදිරිපත් කරලා තියෙන්නේ පිටු 07 ක 08 ක ප්‍රමාණයක්.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** අයවැය හැල්ලු කරන්න එපා.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** මන්ත්‍රීතුමා, තමුන්නාන්සේ කතා කරන වෙලාවේ මම නිශ්ශබ්දව සිටියා. තමුන්නාන්සේත් මහත්මයෙක් වගේ ඉන්න. අපේක්ෂාවට මුල් තැන දෙනවානම් ඉන්න. නැත්නම් අපේක්ෂාව අනපේක්ෂිතභාවයට කර ගන්න එපා. ඒ නිසා අපි කියන්නේ මේ මන්ත්‍රීවරුන්ට විවේකයක් දුන්නත් පැයකින් මේක කියන්න පුළුවන්. කියවන්න බැරි වුණා කියන එක මම පිළිගන්නේ නෑ. නමුත් අපිට උදේ 04 ට නැගිට්ටත්, 05 ට නැගිට්ටත් මේක කියවන්න පුළුවන්. තුන් සූත්‍රය විනාඩි 10 න් කියවන එකේ මේක කියවන එක මොකක්ද. ඒවා මේ විහිළු කතා. ඒක නිසා තමුන්නාන්සේලා මතක තියා ගන්න තමුන්නාන්සේලාගේ වගකීම මොකක්ද කියන එක. තමුන්නාන්සේලා ලැජ්ජාවෙන්න ඕන අපිට අයවැය කියවන්න බැරි වුණා කියන්න. අධ්‍යයනය කරන්න බැරි වුණා ඒ නිසා අපි අයවැයට විරුද්ධයි කියලා එළියට බහින එකට, විරුද්ධයි අද තියන්න බෑ කියන එකට ලැජ්ජාවෙන්න ඕන. අද බෑ කියන්නේ පක්ෂ විපක්ෂව තොරව.

තමුන්නාන්සේලා ලැජ්ජාවෙන්න ඕන ඇත්තටම. තමුන්නාන්සේලාට, අපිට කියන්න පුළුවන්ද ගමට ගිහින් අයවැය ලේඛනය ලැබුණා, දවස් 05 ක් වෙනවා, පිටු 23 යි තියෙන්නේ මේක කියවගන්න බැරි වුණා කියලා. මන්ත්‍රීතුමා ඒක නිසා මේක ගැන මීට වඩා ගැඹුරින් කල්පනා කරන්න කියන කාරුණික ඉල්ලීම කරමින් මම නිහඬ වෙනවා.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා :-** ගරු සභාපතිතුමනි, ඒ වගේම අපේ සියලු මන්ත්‍රීතුමන්ලා, මන්ත්‍රීතුමියන්ලාගෙන් අවසරයි. මේ අවස්ථාවේ මේ අයවැය ඉදිරිපත් වෙලා තියෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** නෑ. අවශ්‍ය නෑ සුගත් මන්ත්‍රීතුමා. අපිට දැන් අද ගැටළුව ඇවිල්ලානේ තියෙන්නේ. ඕක ආයෙත් පුන පුනා අහන්න දෙයක් නෑ. අපි අද අයවැය සභාව අඩාලව කල් තියනවා. දින හතරකට කලින් අපි දැනුම් දෙන්නම් සභාව කවදාද කියලා. අද අඩාලව කල් තියනවා. දැන් කියන්න බෑනේ මන්ත්‍රීතුමා. ඔබතුමාලට දැන් තියන්නත් බැරිනම්.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා :-** අපි කියන්නේ දිනය ඡන්දයට කලින් ගේනවානම් කරන්න බෑනේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** ඔබතුමා හදිසි වෙන්න එපා. දින තුනකට කලින් දැනුම් දෙන්නම් ලිඛිතව. ඡන්දයෙන් පස්සේ තමයි. ඔබතුමන්ලාට ඕන ඒකනේ. මම බබෙක් නෙමෙයි. කාටත් ඕන ඡන්දයට පස්සේ ගේන්නනේ.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා :-** ඡන්දයෙන් පස්සේ අයවැයට කලින් අපි සාකච්ඡාවක් තියා ගමු. මෙවර අපිට තිබුණ වැඩත් එක්ක අපේ යෝජනාවක්වත් මේ කෙටුම්පතේ නැනේ. මේ කෙටුම්පතේ අපේ යෝජනාවක්වත් නැනේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** දින කීයක් කැඳෙව්වාද?. ඔබතුමන්ලා එන්නේ නැති එකට මට කරන්න දෙයක් නෑ සුගත් මන්ත්‍රීතුමා. ඔබතුමන්ලා ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරු විදියට දැන් මේක නැවත වෙනස් කරන්න ඕනද?. ඇයි කැඳෙව්වේ. ඒවාට එන්න එපැයි.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා :-** අපිට කණ්ඩායම් රැස්වීමක්වත් තියා ගන්න බැරි වුණානේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** කණ්ඩායම් රැස්වීමේ තීන්දුයි, මේ තීන්දුයි දෙකක් සුගත් මන්ත්‍රීතුමා. ඔබතුමා කැඳවපු රැස්වීම් වලට ඇවිත් නෑ. ආපු අයගේ නම් මම කියන්නම්. ජූලි මාසේ 30 වෙනිදා රැස්වීමට සුමිත් උප සභාපතිතුමා, ඉන්දික මන්ත්‍රීතුමා, චමින්ද මන්ත්‍රීතුමා, ප්‍රියන්ත මන්ත්‍රීතුමා ඔන්න ඔච්චරයි ඇවිල්ලා තියෙන්නේ කැඳෙව්වට. ඊට පස්සේ අගෝස්තු මාසේ 30 වෙනිදා කැඳවපු රැස්වීමට ඇවිල්ලා තියෙන්නේ තිස්ස මන්ත්‍රීතුමා, වාසනා මන්ත්‍රීතුමිය, ගයාත්‍රි මන්ත්‍රීතුමිය විතරයි.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා :-** ඔහොම කියන කොට අපිටත් කියන්න සිද්ධ වෙනවා. අපි සාමාන්‍යයෙන් වෙනත් කමිටු වලට එනවා. අපිට අතපසුවීමක් වුණා කියමුකෝ ටෙලිෆෝන් එකෙන් කතා කරලා එන්න කියන්න තිබුණා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** ඔබතුමන්ලාගෙන් අයවැය යෝජනා ඉල්ලුවානේ.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා :-** ඒක තමයි. ඒ එකක්වත් අපිට බැරි වුණා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** මම දන්නේ නෑ. මට තේරෙන්නේ නෑ.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා :-** දිගින් දිගට කතා කරන්න ඕන නෑ. ගිය පාර අපි දාපු යෝජනා එකක්වත් ක්‍රියාත්මක වුණේ නෑ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** ඔබතුමාට ප්‍රතිපාදන දීලා වැඩ කරේ නැද්ද?.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා :-** නෑ. මොකක්ද කරේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** මුකුත් කරේ නෑ?. මේ අවුරුද්දටම කිසිම දෙයක් කරේ නැද්ද?.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා :-** මම කිසිම දෙයක් ගත්තේ නෑ.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා :-** එහෙම කරපු එක හරි අසාධාරණයි. බිල් තියෙනවා කිවුවා ලක්ෂ 11 ක.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** ඒ ගිය අවුරුද්දේ මන්ත්‍රීතුමා.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා :-** මේ අවුරුද්දේ මම එකක්වත් කරේ නෑ. කරපු කට්ටිය කහිනවා. අපිට කරන්න දෙයක් නෑ ඕකට. අපිට ඉතිං ඕවට කහින්න බෑ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** ඇයි ඉතිං ඔබතුමා නොකරේ. ඔබතුමාට කිවුවනේ කරන්න කියලා.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා :-** සල්ලි නෑ කියපු නිසා කරේ නෑ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** ඔබතුමාට යෝජනා දාලා කරන්න තිබුණානේ.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා :-** එකඟතාවයකින් තීරණයක් ගන්න.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා :-** එකඟතාවයකින් දිනයක් ගන්න. එදාට කාටවත් කතා කරන්න බෑනේ මට ඉන්න බෑ අරවා මේවා කියලා. මේ අනිත් රජයේ සේවකයොත් ඉන්නවා. ඒ අයටත් නිවාඩු ගන්න පුළුවන් වෙන්න එකඟතාවයකින් දිනයක් ගන්න. එදාට තියමු.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** ඒක තමයි මම කිවුවේ. සභාව අඩාලව කල් තියනවා. දින තුනකට කලින් දැනුම් දෙන්නම් ඡන්දයෙන් පස්සේ.

**(විශේෂ සභාව නැවත දැනුම් දෙන තුරු අඩාලව කල් තබන ලදී.)**

දිල්රුක් එන්. අබේකෝන්,
සභාපති,
බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාව.